**නිවාස ,ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)**

**ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම.**

**ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් වශයෙන් ලියාපදිංචිය සඳහා වූ ආරාධනයයි.**

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY (SUCCESSOR TO ICTAD)

---

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ අංක 45 (4) වගන්තිය අනුව ඉදිකිරීම් වල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය ප්‍රවර්ධනය කිරිම සඳහා ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ නෛතික අනුප්‍රාප්තික ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන අධිකාරිය වශයෙන් ගුණාත්මක කළමනාකරණ විගණකවරුන්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතුය.

තාක්ෂණ විගණන ක්‍රියාපටිපාටිය සහ අයවිය යුතු ගාස්තු පිළිබඳව රීතී ගැසට් පත්‍ර අංක 2057/5 මගින් 2018 පෙබරවාරි මස 02 වන දින ප්‍රකාශයට පත් කර ඇති අතර 2018 අප්‍රේල් මස 05 වන දින ගැසට් පත්‍රයේ පළවූ නියෝග මගින් තාක්ෂණ විගණනය සඳහා අවශ්‍ය වන ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරිමේ ක්‍රියාපටිපාටිය සහ ලියාපදිංචියට අවශ්‍ය සුදුසුකම් දක්වා ඇත.

ගැසට් නිවේදනය අනුව ගුණාත්මක කළමනාකරණ විගණකවරයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්කරු පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

(අ) 2014 අංක 33 දරන පනත යටතේ තාක්ෂණ විගණනය සිදු කිරීමට අදාළ වෘත්තිය සුදුසුකම්;

(ආ) අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවකට නොඅඩු පශ්චාත් උපාධි පළපුරුද්ද;

(ඇ) එකී පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස ලියාපදිංචි කර තිබීම;

(ඇ) අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තිය ආයතනයේ වරලත් සාමාජිකයකු වීම හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යම් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක් යටතේ ලියාපදිංචි වූ තැනැත්තෙකු වීම.

ලියාපදිංචි වීමේ ක්‍රමවේදය, ගාස්තු පිළිබඳ විස්තර සහ අයදුම් පත්‍රය http://www.cida.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබාගත හැක. තවද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07 පිහිටි තොරතුරු මධ්‍යස්ථානයෙන් පෙ.ව 09.00 සිට ප.ව 3.00 දක්වා රාජකාරි දිනයන්හිදී නොමිලේ අයදුම් පත්‍ර ලබාගත හැක. ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා නිසි ආකාරයෙන් පුරවන ලද අයදුම්පත්‍රය, අදාල විස්තර සමග අධ්‍යාක්ෂ ජනරාල්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07 වෙත යොමු කළ යුතුය.

ලියාපදිංචියට අදාළ වැඩිදුර විස්තර අධ්‍යාක්ෂ, උපදේශක සේවා, දුරකථන අංක 011-2688143 මගින් ලබාගත හැක.

සභාපති,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
"සව්සිරිපාය",
123, විජේරාම මාවත,කොළඹ 07
2019.01.04